# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2470/25 - 2026 ජනවාරි මස 07 වැනි බදාදා - 2026.01.07

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## IV (අ) වැනි කොටස - පළාත් සභා

### පළාත් සභා නිවේදන

**මධ්‍යම පළාතේ පළාත් සභාව**

මධ්‍යම පළාත් කළමනාකරණ සේවා නිලධාරී සේවා ව්‍යවස්ථා සංග්‍රහය - සංශෝධන අංක 05

2014 ජූනි මස 30 දින හා අංක 1869/4 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද මධ්‍යම පළාත් කළමනාකරණ සේවා නිලධාරී සේවා ව්‍යවස්ථා සංග්‍රහය පහත දැක්වෙන පරිදි සංශෝධනය කිරීමට මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමා අනුමත කර ඇත.

**7 ඡේදයේ පහත පරිදි සංශෝධනය විය යුතුය.**

7.2.2.1 අධ්‍යාපන සුදුසුකම්:

(අ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, භාෂාව (සිංහල/දෙමළ/ඉංග්‍රීසි) සහ ගණිතය ඇතුළුව විෂයයන් හතරකට සම්මාන සාමාර්ථයන් සහිතව එක් වරකදී විෂයයන් හයකින් (06) සමත්ව තිබීම හෝ විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් ඊට සමාන ලෙස පිළිගනු ලබන විභාගයක් සමාන විෂය සාධනයක් සහිතව එක්වරකදී සමත්වීම.

(අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී සම්මාන සාමාර්ථයක් ලබා තිබිය යුතු භාෂාව ලෙස සලකනු ලබන්නේ අයදුම්කරු කළමනාකරණ සේවා නිලධාරී සේවයට බඳවා ගැනීමේ තරඟ විභාගය සඳහා ඉදිරිපත්වන භාෂා මාධ්‍යයයි)

සහ

(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සියළුම විෂයයන්ගෙන් එක්වර සමත්ව තිබීම (පැරණි විෂය නිර්දේශය යටතේ විෂයයන් 03 කින් එක්වර සමත්ව තිබීම ප්‍රමාණවත්ය.) හෝ විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් ඊට සමාන ලෙස පිළිගනු ලබන විභාගයක් සමාන විෂය සාධනයක් සහිතව එක්වරකදී සමත්විම.


1A - PG 7461 — 04 (2026/01)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

පහත සඳහන් ඡේද කොටස් ඇතුළත් වන අතර අනෙකුත් කරුණු නොවෙනස්ව පවතී.

10.1.2 උසස් කිරීමේ පරීක්ෂණය සමත් වන්නේ III ශ්‍රේණියේ සිට II ශ්‍රේණියට උසස් කිරීම:

(i) උසස් කිරීමේ පරීක්ෂණයට සුදුසුකම් සලකා බලනු ලබන අවසාන දිනට හෝ ඊට පෙරාතුව අවම වශයෙන් III ශ්‍රේණියේ වසර 3 ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇත්තාවූත් වැටුප් වර්ධක 3ක් උපයාගෙන ඇත්තාවූත් සේවයේ ස්ථිර කිරීමට වෙනත් අයුරකින් නුසුදුසු නොවන්නාවූත් නිලධරයන්ට උසස් කිරීමේ පරීක්ෂණයට අයදුම් කිරීමට/ පෙනී සිටීමට අවකාශය ඇති අතර උසස්වීම ලැබීම සඳහා මෙම පරීක්ෂණයෙන් සමත්වීමට අමතරව 10.1.2.1 යටතේ දක්වා ඇති සුදුසුකම් සපුරාලීම අනිවාර්ය වේ.

10.1.2.1 සපුරාලිය යුතු සුදුසුකම්:

i. පත්වීම ස්ථිර කර තිබීම.

ii. සේවා ගණයේ III ශ්‍රේණියේ අවම වශයෙන් වසර පහක (05) සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක පහක් (05) උපයා ගෙන තිබීම.

iii. අනුමත කාර්ය සාධන ඇගයීමේ පටිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර පහක් (05) තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

iv. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූලව දඬුවමක් ලබා නොතිබිය යුතුය.

v. අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් වී තිබීම.

vi. අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා තිබීම.

vii. ඇමුණුම 12 හි සඳහන් II ශ්‍රේණියට උසස් කිරීමේ විභාගය සමත් වී තිබීම.

*සටහන*

1. උසස් කිරීමේ විභාගය පිළිබඳ තොරතුරු හා විෂය නිර්දේශය ඇමුණුම 12 හි දැක්වේ.

2. අදාළ උසස් කිරීමේ විභාගය ප්‍රථම හා දෙවන අනුගාමී වාරවලදී සම්පූර්ණ කරනු ලබන නිලධාරීන් III ශ්‍රේණියේ වසර පහක (5) සක්‍රිය හා සතුටුදායක සේවා කාලය සම්පූර්ණ කරනු ලබන දිනයේ සිට II ශ්‍රේණියට උසස් කරනු ලැබේ.

3. II වන ශ්‍රේණියට උසස් කිරීමේ තෙවන විභාග වාරය සම්පූර්ණ කරනු ලබන නිලධාරීන් III ශ්‍රේණියේ වසර පහක (05) සක්‍රිය හා සතුටුදායක සේවා කාලය සම්පූර්ණ කරනු ලබන දිනය හෝ උසස් කිරීමේ විභාගය සමත් වූ දිනය යන දින දෙකෙන් පසුව එළඹෙන දිනයේ සිට II ශ්‍රේණියට උසස් කරනු ලැබේ.

4. මෙම විභාගයට පෙනී සිටිය හැක්කේ අනුයාත අවස්ථා තුනක් (03) දක්වා පමණි.

අන්තර් කාලීන විධිවිධාන යටතේ 15:4 හා 15:5 වශයෙන් නව වගන්ති දෙකක් සහ අනු වගන්තීන් ඇතුළත් කෙරේ.

15.4 2012.12.22 දින පැවති මධ්‍යම පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයට බඳවා ගැනීමේ විභාගයේ ප්‍රතිඵල මත බඳවාගත් හා එදිනෙන් පසුව සේවයට බැඳුණු මෙම ව්‍යවස්ථා සංශෝධනය ප්‍රකාශයට පත්කිරීමෙන් අනතුරුව පවත්වන II ශ්‍රේණියට උසස් කිරීමේ විභාග සමත්වන නිලධාරීන් පහත සඳහන් පරිදි II ශ්‍රේණියට උසස් කරනු ලැබේ.

(i) II ශ්‍රේණියට උසස් කිරීමේ විභාගයෙන් ප්‍රථම හා දෙවන අනුයාත වාරවලදී සමත්වන නිලධාරීන් 10.1.2.1 හි සඳහන් සුදුසුකම් සම්පූර්ණ කර ඇත්නම්, උසස් කිරීමේ විභාගය සමත් වූ දිනය හෝ III ශ්‍රේණියේ වසර පහක (05) සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කරනු ලබන දිනය යන දින දෙකෙන් පසුව එළඹෙන දිනයේ සිට II ශ්‍රේණියට උසස් කරනු ලැබේ. එම නිලධාරීන් උසස් කිරීමේ විභාගය සමත් වූ දිනට පෙර සම්පූර්ණ කර ඇති III ශ්‍රේණියේ වසර පහකට (05) වැඩි සක්‍රිය හා සතුටුදායක සේවා කාලය උසස් කිරීමේ කාර්යයන් සඳහා II ශ්‍රේණියේ සේවා කාලයක් ලෙස සලකනු ලැබේ.

(ii) තෙවන අවස්ථාවේ දී II ශ්‍රේණියට උසස් කිරීමේ විභාගය සමත්වන නිලධාරීන් වසර පහක (05) සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කරනු ලබන දිනය හෝ උසස් කිරීමේ විභාගය සමත් වූ දිනය යන දින දෙකෙන් පසුව එළඹෙන දිනයේ සිට II ශ්‍රේණියට උසස් කරනු ලැබේ.

15.5 2007.01.01 දිනට පෙර III ශ්‍රේණියට බඳවාගත් සහ 2007.01.01 දින සිට 2013.04.01 දින දක්වා (එනම් 2006.01.21 දින සිට 2010.10.23 දින දක්වා දිනයන්හි පැවති පරීක්ෂණයන් හි ප්‍රතිඵල මත) බඳවා ගන්නා ලද නිලධාරීන්ටද මෙම ව්‍යවස්ථා සංශෝධනය ප්‍රකාශයට පත් කිරීමෙන් අනතුරුව පළමුවරට පවත්වන II ශ්‍රේණියට උසස් කිරීමේ අනුයාත විභාග අවස්ථා තුනකට (3) පමණක් (පූර්ව සේවා ව්‍යවස්ථාව යටතේ ලැබී ඇති විභාග වාර සංඛ්‍යාව ද ඇතුළුව) මුහුණ දිය හැක. එම උසස් කිරීමේ පරීක්ෂණය සමත් වන II ශ්‍රේණියේ නිලධාරීන් පහත සඳහන් පරිදි I ශ්‍රේණියට උසස් කරනු ලැබේ.

(i) උසස් කිරීමේ විභාගයෙන් (පූර්ව සේවා ව්‍යවස්ථාව යටතේ ලැබී ඇති විභාග වාර සංඛ්‍යාවද ඇතුළුව) සමත්වන නිලධාරීන්, 10.2.1.1 හි සඳහන් සුදුසුකම් සම්පූර්ණ කර ඇත්නම් විභාගය පැවැත්වූ දිනය හෝ II ශ්‍රේණියේ වසර පහක (05) සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කරනු ලබන දිනය යන දින දෙකෙන් පසුව එළඹෙන දිනයේ සිට I ශ්‍රේණියට උසස් කරනු ලැබේ. එම නිලධාරීන් උසස් කිරීමේ විභාගය සමත් වූ දිනට පෙර සම්පූර්ණ කර ඇති වසර පහකට (05) වැඩි සේවා කාලයද ඇතුළුව මුළු සේවා කාලය වසර පහළොවකට (15) වඩා වැඩි සක්‍රීය හා සතුටුදායක සේවා කාලය උසස් කිරීමේ කාර්යයන් සඳහා I ශ්‍රේණියේ සේවා කාලය ලෙස සලකනු ලැබේ.

පහත සඳහන් නව ඇමුණුම ඇතුළත් කරනු ලැබේ.

*ඇමුණුම 12*

මධ්‍යම පළාත් කළමනාකරණ සේවා නිලධාරී සේවයේ III ශ්‍රේණියේ නිලධරයන් II ශ්‍රේණියට උසස් කිරීමේ පරීක්ෂණය සඳහා රෙගුලාසි සහ නිර්දේශ පත්‍රිකාව.

01. පරීක්ෂණය පිළිබඳ විස්තරය:

| *ප්‍රශ්න පත්‍රය* | *කාලය* | *මුළු ලකුණු* |
|---|---|---|
| 1. ආයතන කාර්ය හා කාර්ය පටිපාටික රීති | පැය 2 | 100 |
| 2. මූල්‍ය ක්‍රම | පැය 2 | 100 |
| 3. පොදු ප්‍රශ්න පත්‍රය | පැය 1 ½ | 100 |

*සටහන*

(i) සියලුම උත්තර පත්‍රවල නොපැහැදිළි අත් අකුරුවලට සහ අක්ෂර වින්‍යාස දෝෂවලට ලකුණු අඩු කරනු ලැබේ. කියවිය නොහැකි ලෙස අකුරු ලියා ඇති අපේක්ෂකයෝ නුසුදුස්සන් කරනු ලබති.

(ii) සේවයට ඇතුළුවීම සඳහා වූ තරග පරීක්ෂණයකට තමා පෙනී සිටි භාෂා මාධ්‍යයෙන්ම අපේක්ෂකයන් මෙම ප්‍රශ්න පත්‍ර වලට පිළිතුරු ලිවිය යුතුය.

(iii) මෙම තරග විභාගයෙන් සමත්වීම සඳහා සෑම විෂයකටම අවම වශයෙන් ලකුණු සියයට හතළිහක් (40%) ක් සහ විෂයයන් තුන (03) සඳහාම මුළු ලකුණු 130 ට නොඅඩුව එකම විභාගයේදී (එක් වාරයකදී) අපේක්ෂකයන් විසින් ලබා ගත යුතුය.

02. පවත්වන බලධරයා : මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ඉල්ලීම මත විභාග කොමසාරිස් ජනරාල් හෝ පත්වීම් බලධරයා විසින් නම් කරනු ලබන වෙනත් ආයතනයක්.

03. පරීක්ෂණය සඳහා වන විෂය නිර්දේශය :

| *ප්‍රශ්න පත්‍රය* | *විෂය නිර්දේශය* |
|---|---|
| 1. ආයතන කාර්ය හා කාර්ය පටිපාටික රීති | කාර්යාල ක්‍රම පිළිබඳ මූලධර්ම ඒවායෙහි වැදගත්කම, ලිඛිත සන්නිවේදනය, ලිපිගොනුකරණය හා ආකෘති සම්පාදනය යනාදී විෂය ක්ෂේත්‍ර ආවරණය වන පරිදි රජයේ කාර්යාලවල ක්‍රියාත්මකවන කාර්යාල ක්‍රම පිළිබඳ දැනුම හා කාර්යාල කටයුතුවලදී ලබාගත් අත්දැකීම්වල ප්‍රවීණතාවය පරීක්ෂා කිරීම මෙම ප්‍රශ්න පත්‍රයේ අරමුණ වේ.<br><br>රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතීන් හි I වන කාණ්ඩය හා ආයතන සංග්‍රහයේ I වන කාණ්ඩයේ අන්තර්ගත කරුණු පිළිබඳ දැනුම පරීක්ෂා කරන කොටසකින්ද මෙම ප්‍රශ්න පත්‍රය සමන්විත වේ. |
| 2. මූල්‍ය ක්‍රම | (අ) I කොටස - එකතු කිරීමේ හා අඩු කිරීමේ අභ්‍යාස - (ලකුණු 25 ) (එකතු කිරීමේ හා අඩු කිරීමේ අභ්‍යාස සඳහා ගණක යන්ත්‍ර භාවිතා කළ නොහැක. කාලය විනාඩි 15 ක් පමණි.)<br><br>(ආ) II කොටස - රජයේ දෙපාර්තමේන්තු හා අමාත්‍යාංශ කාර්යාලවල භාවිතා වන මුදල් පාලනය, මුදල් භාරකාරත්වය, ආදායම් හා ගෙවීම්, අයවැය ඇස්තමේන්තු, සැපයුම් වැඩ හා සේවා යන විෂය පිළිබඳ දැනුම හා අවබෝධය විභාග කිරීම (ලකුණු 50යි).<br><br>(ඇ) III කොටස - භාණ්ඩ සමීක්ෂණය හා ගබඩාකරණය පිළිබඳ මූලික කරුණු (ලකුණු 25 යි). |
| 3. පොදු ප්‍රශ්න පත්‍රය | මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් යුක්ත වේ.<br><br>(අ) කිසියම් ප්‍රකාශයක් හෝ සාකච්ඡාවක සටහනක් කියවා අවබෝධ කොටගෙන ලිපියක් හා /හෝ වාර්තාවක් පිළියෙල කිරීම.<br><br>(ආ) කාලීන සාමාජීය සිදුවීම් පිළිබඳව අවබෝධ කොට ගෙන විග්‍රහ කර දැක්වීමේ හැකියාව මැනීම. |

විෂය නිර්දේශය හා ඉල්ලුම් කරන ආකාරය පිළිබඳ සම්පූර්ණ විස්තර දැනගැනීම සඳහා මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් වරින් වර ප්‍රසිද්ධ කරනු ලබන ගැසට් නිවේදන කෙරෙහි විභාග අපේක්ෂකයන්ගේ සැලකිල්ල යොමු විය යුතුය.

**කේ. කේ. ජී. අයි. ඩී. පී. විජේතිලක**
ලේකම්,
මධ්‍යම පළාත් සභාවේ
රාජ්‍යසේවා කොමිෂන් සභාව.

2025 දෙසැම්බර් මස 09 වැනි දින,
මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය,
අංක. 244, කටුගස්තොට පාර,
මහනුවර.

EOG 01 - 0058

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.